**බණ්ඩාරගම ප්‍රාදේශීය සභාව**
**කළුතර දිස්ත්‍රික්කය**

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 ඔක්තෝම්බර් 12 දින වන විටද ඉදිරිපත් කර නොතිබුණු අතර සමාලෝචිත වර්ෂය සඳහා සභාවේ ගණුදෙනු පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 ඔක්තෝබර් 30 වන දිනද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 ඔක්තොම්බර් 31 දින ද සභාපතිවරයාට යවා ඇත.

2. අනුකූල නොවීම්

2.1 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | වටිනාකම (රු) | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ (i) 134(1) වගන්තිය | | දියුණු කළ ප්‍රදේශ වශයෙන් ප්‍රාදේශීය සභාව විසින් ප්‍රකාශයට පත් කරන ලද ප්‍රදේශවල වරිපනම් බදු සඳහා නව හඳුනාගැනීමක් සිදු කර නොතිබුණි. | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | 2019 වර්ෂයේදි සභා අනුමැතිය ගෙන ඇත. ඉදිරියේදි මේ සම්බන්ධයෙන් කටයුතු කරමි. |
| (ii) 160 වගන්තිය | - | හිඟ වරිපනම් බදු අය කර ගැනීමේ අවසන් පියවර ලෙසට දේපළ තහනම් කිරීම් කර නොතිබුණි. | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | එකඟ වෙමි.ඉදිරියේදී නියමිත පරිදි කටයුතු කරමි. |
| (ආ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 218 | - | සියලු ඉඩම් ගොඩනැගිලි සෑම වර්ෂයකටම වරක් හෝ පරීක්ෂා කිරීමකට ලක් කර නොතිබුණි. | රීති ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | 2019 වර්ෂයේ සිට නිවැරදි කිරිමට කටයුතු කරමි. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | | | | |
| (i) මුදල් රෙගුලාසි 371(ඇ) | 3,813,717 | කිසියම් කාර්යයක් සඳහා දෙන ලද අත්තිකාරම් මුදලක් අදාළ කාර්යය නිම වූ විගසම පියවිය යුතු වුවත් එසේ කර නොතිබුණි. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතු වේ. | තොරතුරු සොයා ගත නොහැක. |
| (ii) මුදල් රෙගුලාසි 571(1) හා (2) | 17,340,446 | කල් ඉකුත් වූ තැන්පතු පිළිබඳව කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | ඉදිරියේදී නිවැරදි කිරිමට කටයුතු කරමි. |

3. ආදායම් පරිපාලනය

----------------------

3.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

------------------------------------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්,බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2018 පෙබරවාරි 15 සිට 2018 දෙසැම්බර් 31 දක්වා | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 7,089,250 | 7,355,279 | 4,384,441 | 2,970,838 | 6,314,000 | 7,370,955 | 8,152,177 | 1,119,653 |
| (ii) | කුලී | 1,142,750 | 1,578,886 | 1,641,566 | (62,679) | 1,422,000 | 1,528,500 | 1,527,480 | 118,285 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 236,250 | 532,200 | 532,200 | - | 296,000 | 337,650 | 337,650 | - |
| (iv) | වෙනත් ආදායම් | 29,633,625 | 29,633,625 | 6,807,958 | 32,292,032 | 21,662,000 | 6,937,252 | 75,388,820 | 58,632,272 |

## 3.2 ආදායම් රැස් කිරිමේ කාර්යසාධනය

### (අ) වරිපනම් හා බදු

| විගණන නිරික්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2019 ඔක්තොබර් 28 දින වන විට අයවිය යුතු මුළු හිගය රු.263703 ක් විය. | හිග ආදායම් අයකර ගත යුතු වේ. | ඉදිරියේදි අය කර ගැනිමට කටයුතු කරමි. |

### (ආ) ව්‍යාපාර බදු

| විගණන නිරික්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අධිකාරිපත්තු උපකාර්යාලයේ ව්‍යාපාරික ස්ථාන 02 ක් සමීක්ෂණයෙන් මගහැරී තිබූ අතර , එම ආයතනවලින් ව්‍යාපාර බදු අය කිරිමක්ද සිදු කර නොතිබුණි. | නිසි පරිදි ව්‍යාපාර බදු අය කිරිමට කටයුතු කළ යුතු වේ. | පිළිගනිමි. |

## 3.3 වෙළඳ බලපත්‍ර

| | විගණන නිරික්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | අධිකාරිපත්තු උප කාර්යාල සීමාව තුළ පවතින ව්‍යාපාරික ආයතන 15 කට වෙළඳ බලපත්‍ර නිකුත් කර නොතිබුණි. | වෙළඳ බලපත්‍ර ලබා දිමට කටයුතු කළ යුතු වේ. | පිළිගනිමි. |
| (ආ) | සමීක්ෂණයට භාජනය කරන ලද වෙළඳ ස්ථාන 205 න් 69 ක් සඳහා වෙළඳ බලපත්‍ර ලබාදී නොතිබුණි. | වෙළඳ බලපත්‍ර ලබා දිමට කටයුතු කළ යුතු වේ. | පිළිගනිමි. |

## 3.4 කඩකුලි

| විගණන නිරික්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|

| | | |
|---|---|---|
| 2014 වර්ෂයේ ඉදි කිරිම් නිම කර තිබූ නව වෙළද සංකීර්ණයේ උඩු මහල කඩ කාමර 08 බදු දීම සඳහා 2015 වර්ෂයේදී බදු කරුවන් තෝරා ගෙන මාසික කුලී තක්සේරුවක් කර තිබියදීත් 2019 මාර්තු මාසය දක්වා බදු දීම පමා කිරිම හේතුවෙන් සභාවට රු.915,600 ක ආදායමක් අහිමි වි තිබුණි. | නිසි පරිදි ආදායම් එකතු කළ යුතු වේ. | පිළිගනිමි. මෙම මුදල දැනට අය කර ගත නොහැක. |

3.5 සන්නිවේදන කුළුණු ආදායම

| විගණන නිරික්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අධිකාරිපත්තු උපකාර්යාලය බල ප්‍රදේශයේ පවතින සන්නිවේදන කුළුණු 04 කින් කිසිඳු බලපත්‍ර ගාස්තුවක් අයවී නොතිබුණි. | බලපත්‍ර ගාස්තු නිසි පරිදි අයකර ගත යුතු වේ. | පරික්ෂා කර ඉදිරියේදි අය කර ගැනිමට කටයුතු කරමි. |

3.6 උසාවි දඩ හා මුද්දර ගාස්තු

| විගණන නිරික්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු උසාවි දඩ රු.10,034,557 ක් හා මුද්දර ගාස්තු රු.12,574,342 ක් විය. | හිග ආදායම් අය කර ගත යුතු වේ. | අයකර ගැනිමට අවශ්‍ය කටයුතු සිදු කරමි. |

4 මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්ය සාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගි සේවා, සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුඛ විහරණය , පහසුව හා සුභ සාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අතුරු ව්‍යවස්ථා

| විගණන නිරික්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශිය සභා පනතේ 126 වන වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 16 ක් ඉටු කිරිම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබු නමුත් 2018 දෙසැම්බර් 31 දින වන විටත් සභාව විසින් ප්‍රධාන | ප්‍රාදේශිය සභා පනත අනුව අතුරු ව්‍යවස්ථා පනවා ගැනිමට කටයුතු කළ යුතු වේ. | ඉදිරියේදි අතුරු ව්‍යවස්ථා පනවා ගැනිමට කටයුතු කරමි. |

| | | |
|---|---|---|
| කාරණා 05 ක් වෙනුවෙන් පමණක් අතුරු ව්‍යවස්ථා පනවා ගෙන තිබුණි. | | |

(ආ) ක්‍රියාකාරි සැලැස්ම
---------------------

| | | |
|---|---|---|
| (i) 2014 පෙබරවාරි 14 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 3(ආ) වගන්තිය ප්‍රකාරව වාර්ෂික අයවැය පදනම් කර ගත් ප්‍රමුඛතාවය අනුව ක්‍රියාකාරි සැලැස්මක් සකස් කලයුතු වුවද භෞතික මංමාවත් යටතේ ප්‍රග්ධන වියදම් හා ප්‍රග්ධන වත්කම් අළුත්වැඩියා හා නඩත්තු වෙනුවෙන් ඇති කළ රු.මි.50.41 ක ප්‍රතිපාදනය වෙනුවෙන් වූ ව්‍යාපෘති, වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම තුළ හඳුනාගෙන ක්‍රියාත්මක කර නොතිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව නිවැරදිව ක්‍රියාකාරි සැලැස්ම සකස් කළ යුතු වේ. | ඉදිරියේදි නිවැරදිව කටයුතු කරමි. |
| (ii) ක්‍රියාකාරි සැලැස්මේ අපේක්ෂිත නිමවුම් හා ප්‍රතිඵල අනුව කාර්යය සාධනය ඇගයිම් කල යුතු වුවද ,එම ක්‍රියාකාරකම් සඳහා වාර්ෂික කාර්යය සාධනය මිණුම් කිරිමේ ක්‍රමවේදයක් සභාව සතුව නොතිබුණි. | කාර්යය සාධන මිණුම් කිරිමේ ක්‍රම වේදයක් සකස් කළ යුතු වේ. | එකඟවෙමි.ඉදිරියේදී ක්‍රමවේදයක් සකස් කරමි. |

(ඇ) ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය
----------------------------------

| | | |
|---|---|---|
| කසළ කළමනාකරණය සම්බන්ධයෙන් අතුරු ව්‍යවස්ථාවක් පනවා නොතිබුණ අතර කසළ පිරිවැය අවම කර ගැනීම සඳහා කසළ බදු පැනවීමක්ද සිදු කර නොතිබුණි. | අතුරු ව්‍යවස්ථාවක් පැනවිය යුතුවේ. | අතුරු ව්‍යවස්ථාවක් හා කසල බදු පැනවීමට ඉදිරියේදී කටයුතු කරමි. |

(ඇ) තිරසර සංවර්ධන ඉලක්ක
-----------------------------

| | | |
|---|---|---|
| 2030 න්‍යාය පත්‍රය පිළිබඳව සභාව 2018 වර්ෂයේ මැද භාගයේදී දැනුවත් වී තිබුණ අතර මෙම අරමුණු වලට අනුගතව 2018 වර්ෂයේදී දිගු කාලින සැලසුම් සකස් කර නොතිබුණි. | දිගු කාලින සැලසුම් සකස් කළ යුතු වේ | ඉදිරියේදි කටයුතු කරමි. |

4.2 මානව සම්පත් කළමනාකරණය
-------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාවේ කාර්ය මණ්ඩල තොරතුරු අනුව 2019 සැප්තැම්බර් 06 දින වන විට ද්විතියික මට්ටමේ පුරප්පාඩු 03 ක් හා ප්‍රාථමික මට්ටමේ පුරප්පාඩු 08 ක් පැවති අතර කළමනාකරණ සහකාර තනතුරක අතිරික්තයක් විය. | සේවක පුරප්පාඩු පිරවිය යුතුවේ. | බඳවා ගැනිමට කටයුතු කරමි. |

4.3 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) ප්‍රයිම් ලැන්ඩ් පුද්ගලික සමාගම විසින් 2018 වර්ෂයේදි වෙන්දේසි කරනු ලැබූ කොස්ගහවත්ත නොහොත් කුරුදුගහවත්ත ඉඩමෙන් සභාවට වෙන් කර දි තිබූ රූඩ් 1 පර්චස් 25.14 ක භූමියේ වැට මායිම් ගසා සභාවේ දේපළක් වශයෙන් වෙන් කර නොතිබුණි. | වැට මායිම් සකස් කළ යුතු වේ. | වැට මායිම් සකස් කිරිමට අදාළ ආයතනවලට දන්වා ඇත. |
| (ආ) 2018 දෙසැම්බර් කිදෙල්පිටිය , කැන්දලන්ද වෙන්දේසි ඉඩමේ පොදු පහසුකම් සඳහා වෙන්කර ඇති පර්චස් 106 ක ප්‍රමාණය කළුගඟ ව්‍යාපෘතියේ ජල ටැංකිය ඉදිකිරිම සඳහා පවරා දී තිබුණු අතර පැවරීමට අදාල ඔප්පුව හා ගිවිසුම ඉදිරිපත් නොකෙරුණි. | පැවරිමට අදාල ගිවිසුම හා ඔප්පුව ඉදිරිපත් කළ යුතුවේ. | ඔප්පුව හා ගිවිසුම ලබා ගැනිමට කටයුතු කර නැත. |

4.4 ප්‍රසම්පාදනය

4.4.1 ප්‍රසම්පාදන සැලැස්ම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4 .2.1 වගන්තිය ප්‍රකාරව ප්‍රසම්පාදන සැලැස්මක් සකස්කර නොතිබුණි. | ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව කටයුතු කළ යුතුය. | ඉදිරියේදි විධිමත් පරිදි ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කිරිමට කටයුතු කරමි. |

4.4.2 කොන්ත්‍රාත් පරිපාලනය

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ----------------------- | ------------ | ---------------------- |
| (අ) | මාර්ග ඉදිකිරිමේදී ABC මිශ්‍රණ අනුපාතයන් තත්ත්ව පරික්ෂණ වාර්තාවලින් තහවුරු කර ගැනීමෙන් තොරව වැඩි රේටයක් ගෙවා තිබුණි. තවද කාණු හා බෝක්කු ඉදි කිරීම සඳහා භාවිතා කරනු ලබන කොන්ක්‍රීට්වල මිශ්‍රණ අනුපාතය පරික්ෂා කිරිමේ ක්‍රමවේදයක් නොමැතිව රු.1,885,892 ක් කොන්ත්‍රාත් 06 ක් වෙනුවෙන් ගෙවා තිබුණි. | කොන්ක්‍රීට් මිශ්‍රණ සහ ABC මිශ්‍රණයන්හි අනුපාත සකස් කිරිමේ ක්‍රම වේදයක් සකස් කල යුතුවේ. | ඉදිරියේදි නියමිත පරිදි කටයුතු කරමි. |
| (ආ) | ඉදි කිරිම් සඳහා ගෙවීම් කිරිමේදී කොන්ත්‍රාත් සමිති නිලධාරියෙකු හා සභාවේ බලය ලත් නිලධාරියෙකු විසින් ඒකාබද්ධව මිණුම් ලබාගෙන අවසන් ගෙවීම් තහවුරු කලයුතු වුවද , එසේ මිණුම්පත්‍ර ලබාගැනීමකින් තොරව කර්මාන්ත 04 ක් වෙනුවෙන් රු.3,753,353 ක් ගෙවා තිබුණි. | ඒකාබද්ධ මිනුම් ලබා ගැනිමට කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදි නියමිත පරිදි කටයුතු කරමි. |
| (ඇ) | කොන්ත්‍රාත් සමිති විසින් කරනු ලබන අමුද්‍රව්‍ය මිළදී ගැනීම් පරික්ෂා කිරිමේ ක්‍රමවේදයක් නොමැතිව අමුද්‍රව්‍ය වෙනුවෙන් කොන්ත්‍රාත් සමිති 05 ක් සඳහා රු.2,203,331 ක් ගෙවා තිබුණි. | ඇස්තමේන්තු සමග ද්‍රව්‍ය විශ්ලේෂණ වාර්ථා ලබා දිමට කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදි නියමිත පරිදි කටයුතු කරමි. |
| (ඈ) | අරුක්ගොඩ ශ්‍රී ඉන්ද්‍රසාර මාවතේ දොඹගහවත්ත මාර්ගය සංවර්ධනය කිරිම සඳහා රු.497,318 ක් ගෙවා තිබූ අතර 2019 ජූලි 25 දින භෞතික පරීක්ෂාවේදී මාර්ගයේ ගල් මතුවී ගුණාත්වය අඩු මට්ටමක පැවතුණි. | මාර්ග ප්‍රමිතියට අනුව ඉදිකිරීමට කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදි නියමිත පරිදි කටයුතු කරමි. |